# 9 ශ්‍රේණිය - චිත්‍ර කලාව

නිපුණතාව 6. 0 : ආගමික හා සංස්කෘතික අංග, දෙස්, විදෙස් තෝරාගත් ශිල්පීන්ගේ කලා නිර්මාණ, අද්‍යතන දෘශ්‍ය කලා කෘති හා ජනමාධ්‍ය ඇසුරින් හඳුනා ගත් කලා නිර්මාණ විචාරශීලී ව රසාස්වාදයට ලක් කරමින් ස්වතන්ත්‍ර නිර්මාණ සඳහා භාවිතයට ගනියි.

නිපුණතා මට්ටම 6.1 : ශ්‍රී ලංකාවේ පාරම්පරික වෙස්මුහුණු කර්මාන්තය ආශ්‍රිත කලා නිර්මාණ අධ්‍යයනය හා රසාස්වාදය කරයි.

# වෙස් මුහුණේ වත ගොත






# ඓතිහාසික පසුබිම සහ වෙස් මුහුණු නිර්මාණය සඳහා පාදක වූ වස්තු විෂය

ලෝකයේ බොහෝ රටවල ප්‍රාග් ඓතිහාසික හා ප්‍රාග් කෘෂිකාර්මික යුගවල වෙස් මුහුණු භාවිත කිරීම සිදු කර ඇත. වර්ෂාව, ආහාර (දඩයම් හා බව භෝග) හා ලෙඩදුක් (ආරක්ෂාව) වැනි එදිනෙදා විවිධ කටයුතු සඳහා යාතුකර්ම පැවත්විමත් එම විවිධ අවස්ථාවල වෙස් මුහුණු භාවිත කිරීමත් සිදු වි ඇත. විශේෂයෙන් දඩයක්කාර දිවි පෙවතක් ගෙවූ ගෝත්‍රික ජනතාව සතුන් බියවැද්දිම, සතුන්ගෙන් ආරක්ෂා ව ලබා ගැනීම වැනි කරුණු පදනම් කරගෙන වෙස් මුහුණු පැළඳ ඇත.

**ලෝකයේ ආදි මානවයන් භාවිතා කළ වෙස්මුහුණු**








# ශ්‍රී ලංකාවේ ප්‍රචලිත ප්‍රදේශ

## බෙන්තර


## රයිගම් කෝරළය - බණ්ඩාරගම





## අම්බලන්ගොඩ




## මිරිස්ස




## මතුගම



## අමුද්‍රව්‍ය -භාවිතයට ගනු ලබන දැව වර්ග

දිය කදුරු

රුක් අත්තන





ශිල්ප ක්‍රම - අනවශ්‍ය දේ ඉවත් කර අවශ්‍ය හැඩය මතුකර ගැනීමේ නෙළීමේ ශිලප ක්‍රමය
වර්ණ කරීමේ ශිලප ක්‍රමය

තාක්ෂණය -

- වෙස් මුහුණක් නිර්මාණය කිරීමේ පළමු පියවර වන්නේ ලී කඳන් කපා පොතු ගසා කැබලිවලට කපා ගැනීම යි. මෙය **ගණ කැපීම** ලෙස හැඳින්වේ. ඉන් පසුව එම ලී කොටයේ ඇති ගැට සහිත තැන් කපා පැතලි හැඩයක් සකස් කර ගනියි. මෙය **පායම් පෑහීම** නම් වේ. මෙසේ සකස් කොට ගත් ලීය මත වෙස් මුහුණේ දළ හැඩය සළකුනු කොට ලීයේ ප්‍රමාණය මුහුණේ ප්‍රමාණය තෙක් අඩු කර ගැනේ.

- ඉන් පසු ව කැටයම් කිරීමට සහ වර්ණ කිරීමට පහසු වන සේ ලීයේ ඇති අධික කිරි ගතිය ඉවත් කොට කදුරු ලීය පදම් කර ගැනීම සඳහා දුමේ දමා හෝ මඳ අව්වේ දමා හෝ වේළා ගත යුතු ය. මෙය **කිරි හිඳවීම** යනුවෙන් හැඳින්වේ.

- ඉන් පසු මුහුණේ අවශ්‍ය හැඩය මතු කොට ගනී. මුහුණේ ඇස් නාසය වැනි සියුම් අංග මතුකිරීම **ලකුණු කැපීම** ලෙස හඳුන්වයි. එමෙන් ම මිනිසකුගේ මුහුණේ ප්‍රමාණයට ගැළපෙන පරිදි වෙස් මුහුණේ ඇතුළු පැත්ත හාරා ඉවත් කර ගැනීම මේ අවස්ථාවේ දී සිදු කෙරේ. මෙහි කල් පැවැත්ම උදෙසා අතීතයේ දී යළිත් මාස තුනක් පමණ දුම්මැස්සේ දමා වේලා ගනු ලැබේ.

- ඉන් පසු ව වෙස් මුහුණට අවශ්‍ය අනෙකුත් අංග වන හිසකෙස්, දැළි රැවුළ සහ උඩ රැවුළ, දත්, ඔටුනු ආදිය වෙන ම සාදා වද්දනු ලැබේ.








**වෙස් මුහුණු වර්ණ ගැන්වීම**

- වෙස් මුහුණු වර්ණ කිරීමට ප්‍රථම එහි සුදු පැහැති මූලික ආලේපනයක් තවරා ගනු ලැබේ. අතීතයේ දී මෙම සුදු පැහැති වර්ණය සඳහා කිරි මැටි හෝ මකුළු මැටි හෝ දිය කර පෙරා ගැනීමෙන් සකස් කර ගනියි. මේවා **අල්ලියාදු** නමින් හැඳින්වේ.

- ඉන් පසු මෙම සුදු පැහැති පසුබිමේ ඒ ඒ වෙස් මුහුණට උචිත ආකාරයට වර්ණ ආලේපනය සිදු කර යි.

- වෙස් මුහුණු නිර්මාණය කළ සාම්ප්‍රදායික ශිල්පීන් අතීතයේ දී කහ වර්ණය සඳහා හිරියල් ද, රතු වර්ණය සඳහා සාදිලිංගම් ද, සුදු සඳහා මකුළු මැටි ද යොදා ගෙන ඇත. එමෙන් ම බෝවිටියා, කී කිරිඳිය, රණවරා, මෑ ආදී පැළෑටිවලින් දම් සහ කොළ වර්ණ සාදා ගෙන ඇත. (වර්තමානයේ දී මෙම වෙස් මුහුණු වර්ණගැන්වීම සඳහා බොහෝ විට කෘතිම වර්ණ මේ සඳහා භාවිතයට ගැනේ.)

- අතීතයේ දී, වර්ණ ආලේපනයෙන් පසු කල් පැවැත්ම, තෙතමනයට ඔරොත්තු දීම මෙන් ම මතුපිට දිස්නයක් ලබා දීම සඳහා වෙස් මුහුණු මත දොරණ තෙල් තැවරීම සිදු කරනු ලැබ ඇත.

## වෙස් මුහුණු වර්ග

සාම්ප්‍රදායික යාතු කර්ම සහ ජන නාට්‍ය උදෙසා ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික වෙස් මුහුණු නිර්මාණය කොට තිබේ. මේ සඳහා නිර්මාණය කරන ලද වෙස් මුහුණු වර්ග කිහිපයක් වේ.

- රජ මුහුණු
- රාක්ෂස මුහුණු
- යක්ෂ මුහුණු
- නාග කන්‍යා මුහුණු
- සන්නි මුහුණු
- කෝලම් මුහුණු

- මූලාශ්‍රය - - කෝලම් මුහුණු සහ ලංකාවේ වෙස් මුහුණු - ආචාර්ය එම්. එච්. ගුණතිලක

  - සිංහල කෝලම් සම්ප්‍රදාය - ගාමිණී දැල බණ්ඩාර





නාග රාක්ෂ



ගුරුළු රාක්ෂ



ගරා යකා




ඡායාරූප උපුටා ගැනීම - වෙස් මුහුණු කලාව, ජේ. ඩබ්. හද්‍රානන්ද



කෝර සන්නිය



දේව සන්නිය



නාග සන්නිය



ගමේ විදාන ආරච්චි



හේවා කෝලම



පරංගි කෝලම

පහත වීඩියෝ නරඹන්න

https://youtu.be/-C_Bps8zWKA

https://youtu.be/Sxz05OeWM7s

**පහත ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න**

01. වෙස්මුහුණු කර්මාන්තයට වඩාත් ප්‍රසිද්ධ ප්‍රදේශ සහ ඒ සඳහා යොදා ගන්නා අමුද්‍රව්‍යය නම් කරන්න.
02. පාරම්පරික වෙස්මුහුණු කර්මාන්තය සඳහා යොදාගන්නා තාක්ෂණ ක්‍රම ශිල්ප ක්‍රම, සහ උපකරණ පිළිබඳව විස්තර කරන්න.
03. වෙස් මුහුණු නිර්මාණ සඳහා පාදක වන වස්තු විෂයන් විස්තර කර වෙස් මුහුණු වර්ග නම් කරන්න.

**පහත වචන පැහැදිලි කරන්න**

**අම්බලන්ගොඩ, ගණකැපීම, පායම් පැහීම, ලකුණු කැපීම, අල්ලියාදු, දොරණතෙල්**